## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2014

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්ව වාර්තාව, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතින් සංශෝධිත 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව ආදායමින් වියදම් හිලව් නොකළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ ලැබූ වාහන කුළී ආදායම් හා විශ්වවිද්‍යාලයේ ජාතික බෞද්ධ සම්මන්ත්‍රණය සඳහා පැමිණි සාමාජිකයින්ගෙන් අයකරන ලද ගාස්තු එකතුව රු.795,658 ක් ආදායම් ලෙස දක්වනු වෙනුවට වියදම් වලින් අඩු කර දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා ලබාදුන් රු.487,542 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු.112,402 ක් කොටස් බිල්පත් වලින් අය කරගෙන තිබූ නමුත් ලබා දුන් මුළු මුදලම අත්තිකාරම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.112,402 ක් වැඩියෙන්ද කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ආ) ශ්‍රම සැපයුම් සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු රු.177,350 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) නව ජල සම්පාදන පද්ධතියේ 2014 වර්ෂයට අදාලව ක්ෂය රු.237,272 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද වත්කම්වල ශුද්ධ අගය වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය විසින් 2014 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායම රු.860,618 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ ඌනතාවයෙන් අඩු කිරීම හා මුදලින් ලද පොළී ආදායම රු.616,761 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස ගලපා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල වත්කම් අලෙවි කිරීමෙන් ලද රු. 71,781ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස ගලපා නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ සිදු වූ ඇස්තමේන්තු දෝෂ හේතුකොටගෙන වියදම සඳහා වූ රු.300,217 ක ඌන වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැරීම වෙනුවට ඉකුත් වර්ෂයේ ලාභයට ගලපා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 1.2 මාර්ගෝපදේශය | තරඟකාරී මිලගණන් කැඳවා සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සහභාගී වීමට අවස්ථාව ලබාදීමෙන් තොරව උද්‍යාන අලංකරණ කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට පවරා ඒ වෙනුවෙන් රු. 548,833ක් ගෙවා තිබුණි. |
| (ii) 5.3.4 ඇ මාර්ගෝපදේශය | කොන්ත්‍රාත්තුවක් සඳහා ලංසු කැඳවීමේ ලේඛන නිර්මාණය කිරීම හෝ සකස් කිරීම සඳහා උපදේශන සේවා ලබා ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සේවයේ යොදවනු ලැබූ යම් කොන්ත්‍රාත්කරුවෙකුට හෝ සැපයුම්කරුවෙකුට එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනු නොලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ඉටු කෙරෙමින් පැවතුණ මූලධන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් කොන්ත්‍රාත්කාර ආයතනය වූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට උපදේශක සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුවද පවරා ඒ වෙනුවෙන් රු.26,431,776 ක් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 772 | වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 47,327ක් වටිනා භාවිතයට ගත නොහැකි බවට, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති භාණ්ඩ තොගය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 1/2014 හි 2.1.5 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවකයන් වෙත කෙරෙන සියළුම ගෙවීම් අදාල චක්‍රලේඛයන්ට අනුකූල විය යුතු අතර එම චක්‍රලේඛයන්ට පරිබාහිරව කටයුතු කිරීමට අවශ්‍ය නම් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය හා භාණ්ඩාගාරයේ එකඟතාවය මත අදාල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ගෙවීම් සිදුකළ හැකි බව පෙන්වා දී තිබුණද ඊට පටහැනිව ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ බාහිර පාඨමාලාවන්හි කටයුතු කිරීම වෙනුවෙන් ආයතනයේ අධ්‍යයන

හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට විධිමත් අනුමැතියකින් තොරව **2014** වර්ෂයේදී එකතුව **රු.873,775**ක අමතර දීමනා ගෙවා තිබුණි.

(ආ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1528(A) හා 2014 ජුලි 01 දිනැති ලිපිය පදනම් කරගෙන නිකුත් කරන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක **07/2014** හා **2014** ජුලි **17** දිනැති චක්‍රලේඛය ප්‍රකාරව **2011/2012** අධ්‍යයන වර්ෂය පාදක කොටගෙන සියයට **10** ක අතිරේක ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා පවතින ශිෂ්‍ය ඉල්ලුම අඩු වන්නේ නම් ඉල්ලුම වැඩිකර ගැනීම සඳහා අවශ්‍ය නව්‍යකරණ වැඩ පිළිවෙලක් සැකසීමට ක්‍රියාමාර්ග ගත යුතු බවත්, ඒ සඳහා දිරි ගැන්වීමක් ලෙස විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මූලික වැටුපෙන් සියයට **20** ක අතිරේක දීමනාවක් ගෙවිය හැකි බව දන්වා තිබුණි. නමුත් භික්ෂු විශ්වවිද්‍යාලය ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් **2011/2012** අධ්‍යයන වර්ෂයට සාපේක්ෂව විශ්වවිද්‍යාලයේ **2013/2014** වර්ෂයේදී බඳවා ගන්නා ලද ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා සංඛ්‍යාව සියයට **14.5** කින් අඩු වී තිබියදී හා ඉදිරියේදී ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩිකිරීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක්ද සකස් නොකර තිබියදීත් සියයට **20** ක අමතර දීමනා ලබා ගැනීමට හිමිකම් නොමැති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් **95** දෙනෙකු සඳහා **2014** වර්ෂයේ ජුලි මාසයේ සිට දෙසැම්බර් දක්වා එකතුව **රු.8,451,904** ක දීමනාවක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය තුල විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලයේ **රු.4,615,312** ක ඌනතාවයක් ඇතිවී තිබුණු අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය **රු.1,496,395** ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ **රු.6,111,707** ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය **රු.14,457,161** කින් වැඩිවීම හා පාරිතෝෂික ගෙවීම් සහ හැකියා වර්ධන වියදම් **රු.9,611,912** කින් වැඩිවී තිබීම වර්ෂයේ ඌණතාවය ඇතිවීමට හේතුවී තිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ **2013** වර්ෂයට සාපේක්ෂව **2014** වර්ෂයේදී වැය විෂයයන් **07** ක සියයට **27** සිට සියයට **50** දක්වා අසාමාන්‍ය වියදම් වැඩිවීම් පැවතිණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලයේ **2012** වර්ෂයට සාපේක්ෂව **2013** වර්ෂයේ සහ **2014** වර්ෂයේ මුළු වියදම්වල වැඩිවීම පිළිවෙලින් සියයට **283** ක් හා සියයට **300** ක් වුවත්, ශිෂ්‍ය සංඛ්‍යාව ඊට සාපේක්ෂව වර්ධනය වීමක් දක්නට නොලැබුණි. එනම් **2014** වර්ෂයේ ශිෂ්‍ය බඳවා ගැනීම් සියයට **15** කින් අඩුවී තිබූ අතර ශිෂ්‍යයින් බඳවා ගැනීම වැඩිකිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග විශ්ව විද්‍යාල පරිපාලනය විසින් ගෙන ඇති බවට සාක්ෂි විගණනයට නිරීක්ෂණය නොවීය.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ ස්වාමීන් වහන්සේ නමක් විසින් ලබාගන්නා ලද අධ්‍යයන නිවාඩු අවසන් වීමෙන් අනතුරුව නියමිත දින රාජකාරියට වාර්තා නොකිරීම හේතුවෙන් ගිවිසුම් කඩ කිරීම මත අය කර ගත යුතු රු.363,628 ක් වර්ෂය අවසාන වන විටද උන්වහන්සේගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.2** අරමුදල් ඌන උපයෝජනය

විශ්වවිද්‍යාලයේ බාහිර පාඨමාලාවල ගණුදෙනු සඳහා පවත්වාගෙන යන බැංකු ගිණුමෙහි වර්ෂය පුරාම සාමාන්‍ය ගිණුම් ශේෂය රු. මිලියනය ඉක්මවා තිබූ අතර එය ඵලදායී ආයෝජනයක යෙදවීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

**4.3** නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට 2013 වර්ෂය දක්වා විශ්ව විද්‍යාලයට පරිත්‍යාග හා ත්‍යාග වශයෙන් ලද රු.4,067,078 ක් ද, සමාලෝචිත වර්ෂයේ ලද රු.91,100 ක් ද, එම මුදල් ආයෝජනයෙන් ලද රු. 571,227 ක පොළී ආදායමද ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබූ අතර එම අරමුදල් පරිත්‍යාග ලබා ගැනීමේ අරමුණු වලට අදාල කටයුතු වෙනුවෙන් උපයෝජනයට යොදාගෙන නොතිබුණි.

**4.4** කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විශ්වවිද්‍යාලය සඳහා රු. මිලියන 300 ක පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාළව පහත සඳහන් කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.10 මාර්ගෝපදේශ හා 3.11 ට පටහැනිව ද්විත්ව කවර ක්‍රමයට (Turnkey Basis) ප්‍රසම්පාදන ක්‍රමය තෝරාගෙන තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 06 දින අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සුදුසුකම් ලත් ලංසුකරුවන් 05 දෙනෙකුගේ මිල ගණන් පදනම් කරගෙන කොන්ත්‍රාත්කරුවන් තෝරාගත යුතු වුවද, ඉදිකිරීම් පවරන ලද කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් පමණක් පදනම් කරගෙන තරඟකාරිත්වයකින් තොරව රු.300,000,000 ක ඇස්තමේන්තු මිලෙන් සියයට 99.4 ක් වූ රු.298,273,258 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ඇ) ලංසු ලියකියවිලිවල විෂය අංක C 1.3.1 Excavation Earth Work යන විෂයයට රු.4,548,160 ක් ගෙවා තිබූ අතර, මෙම විෂය යටතේ ඉටු කිරීමට තිබූ කාර්ය භාරය වනුයේ පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ අත්තිවාරම් පිරවීමේ කාර්ය පමණි.

(ඈ) කොන්ත්‍රාත්තුවට අදාළ වෙනත් උප ක්‍රියාකාරකම් යටතේ මාර්ග සකස් කිරීම හා උද්‍යාන අලංකරණය සඳහා රු.7,000,000 ක් ගෙවීමටද එකඟ වී තිබුණි. වැඩ බිම පරීක්ෂා කිරීමේදී උද්‍යාන අලංකරණය හා මාර්ග සකස් කිරීමේ කාර්ය ඉටුකිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම සම්බන්ධයෙන් වූ **ICTAD/SBD/04** දරන ප්‍රමිත කරන ලද ලංසු ලියකියවිලි ප්‍රකාරව ප්‍රසම්පාදන ලියකියවිලවල **Preliminaries** යටතේ **Provisional sum** ලෙස දැක්විය යුතු අයිතම **Lump sum** අයිතම යටතේ දැක්වීම හේතුවෙන් ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරුගේ සත්‍ය වියදම පමණක් ගෙවීම වෙනුවට සත්‍ය වියදම ඇතුළත් බිල්පත් ඉදිරිපත් කිරීමකින් තොරව ලංසුවේ සඳහන් මුළු මුදලම ගෙවීමට එකඟ වී එම විෂය සඳහා රු.**3,941,121**ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඊ) කොන්ත්‍රාත්කරුගේ පොදු කාර්යය වියදම් හා ලාභාංශ සඳහා වෙනමම කොන්ත්‍රාත්කරු රු.**1,000,000** ක් ලංසුවට ඇතුලත් කර තිබියදී කොන්ත්‍රාත් පොදු කාර්ය වියදම ලෙස ගැනෙන ඉදිකිරීම් වලට අදාල වැඩබිමේ ජලය හා විදුලිය පරිභෝජන වියදම් Preliminaries යටතේ රු.**3,500,000** ක මිල ගණන් ඉදිරිපත් කර තිබු අතර එම කොටස් ගෙවීමට එකඟ වී මෙම වාර්තාවේ දින වන විට රු.**1,750,000**ක් ගෙවා තිබුණි.

**4.5** කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු **24** ක හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු **8** ක පුරප්පාඩු පැවතුණි.

**4.6** පුස්තකාල පරිපාලනය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල පුස්තකාලයෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය හා ස්වාමීන් වහන්සේලා සඳහා බැහැර දෙන ලද පොත් **40** ක් නැවත භාරදිය යුතු නියමිත දින ඉක්මවා මාස **01** සිට මාස **15** ක දක්වා කාලයක් ගතවී ඇතත් නැවත භාරදී නොතිබුණි.

**4.7** අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය පුරාවටම අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර ආයතනයේ අභ්‍යන්තර විගණනය සතුටුදායක මට්ටමකින් ක්‍රියාත්මක වන ආකාරයක් නිරීක්ෂණය නොවීය.

**5.** පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි තවදුරටත් විශේෂ අවධානය යොමු කළයුතුව ඇත.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) අයවැය පාලනය
(ඈ) මූල්‍ය පාලනය හා ආදායම් රැස් කිරීම